# මේ මහ කන්ද






සිංහල ගීත රස විඳින බොහෝ දෙනෙකු වඩාත් ප්‍රිය කරන ගීත මොනවාදැයි සමීක්ෂණයක් කළහොත්, ඉන් වැඩි ගීත ප්‍රමාණයක් හැටේ සහ හැත්තෑව දශකයේ නිර්මාණය වූ ඒවායි. ආනන්ද සමරකෝන්, සුනිල් ශාන්ත වැනි මුල් යුගයේ සංගීත වේදීන් නිර්මාණය කර ගායනා කළ සිංහල ගීතය වෙනත් මඟකට යොමු කරවීමෙහි ලා පුරෝගාමී වූ සංගීතවේදියෙකි, පණ්ඩිත් අමරදේවයන්. එ දවස එතුමන් වෙනුවෙන් ගී පබැඳිමින් සිංහල ගීත සාහිත්‍ය නැංවීමෙහි ලා මහගු කර්තව්‍යයක් කළ ගී පද නිබන්ධකයෙකි, සුනිල් සරත් පෙරේරා වියතාණන්. අමරදේවයන්ට මතු නොව එදා මෙදා තුර බොහෝ ප්‍රවීණයින් වෙනුවෙන් සිය පෑන් තුඩ මෙහෙයවමින් සුභාවිත ගීතය වෙනුවෙන් පෙනී සිටිනා එතුමා මේ දිනවල මෙල්බර්න් නුවර නිවාඩුවක් ගත කිරීම සඳහා පැමිණ සිටියි. "නිවාඩුවක්" ලෙසින් කියූවද හිත මිතුරා, ඥාතී, රසික පිරිස් අතර නිවාඩුවකින් තොරව සිටි එතුමා "ගී සඳැළුව" පාඨකයන් වෙනුවෙන් පැය ගණනාවක්ම වෙන් කිරීමට කාරුණික විය. එතුමාණන් හා කළ පිළිසඳර "ගී සඳැළුව" ලිපි ගණනාවකින් වරින් වර පළකරන්නට අදහස් කරනා අතර, මේ ඉන් පළමුවැන්නයි.

"මගේ ගීත ගැන කතා කරනකොට මුලින්ම කියන්න කැමතියි, මේ කරන්නේ විවරණයක් විනා ගුණාගුණ කතා කිරීමක් නොවේය කියලා...." සුනිල් සරත් පෙරේරා ගීත නිබන්ධකයාණන් අප හා පිළිසඳරට එක් වූයේ එලෙසින්.

"මගේ ගීත ගත්තහම එක අතකින් කාලයත් අනික් අතින් අනිත්‍යතාවයත් තමයි කියන්නට බලාපොරොත්තු වුනේ." ඒ වගේම අනිත්‍යතාව තුළින් බිහිවන සුන්දරත්වය ගැනත් කතා කරන්නට මම උනන්දු වුණා. නමුත් මම විවිධ විෂය ක්ෂේත්‍රයන් තුළ ගීත ලියලා තියෙනවා."

"ඒ අතින් ගත්තොත් මම "මහ බැංකුවේ තේමා ගීතයත් ලියලා තියෙනවා" ඒ වගේම ක්‍රීඩා ගීත, පාසල් ගීත, විවිධ අවස්ථා අලලා ලියවුණ ගීත වගේ ගීතත් ලියලා තියෙනවා. ආචාර්ය එන්. එම්. පෙරේරා මහත්තයා වියෝ වුණු වෙලාවේ එතුමන් ගැන ලියූ ගීතය, මහවැලිය හැරවූ වෙලාවේ ඒ පිළිබඳව ඒ උත්සවයට ලියූ ගීත ඒ අතරින් මතක් කරන්න පුළුවන්. ඒ විධියට ගත්තොත් මගේ ගීත රචනා සාහිත්‍යය විශාල පරාසයක විහිදුන විවිධත්වයක් දරණවා.

"ඒත් මා අතින් ලියවිලා ජනප්‍රිය වුණ ගීත බොහෝ විට අත්දැකීම් ඇසුරින් ලියවුණ ඒවා. අත් දැකීමක් කියලා කියන්නේ අතිශය පුද්ගලික අත්දැකීම් පමණක් නෙවෙයි. අත්දැකීම් ලබාගන්න පුළුවන් විවිධ ආකාරවලට. කුඩා කාලයේ පටන් විවිධ අන්දමට අප ලබාගන්නා අත්දැකීම් සම්භාරයක් තියෙනවා. ඉතින් ඒවායින් ලබපු වින්දනය තමයි අපි විවිධාකාරයෙන් ලියන්නේ. මේ අතරින් සමහර ගීත ජනප්‍රිය වෙනවා.

ඉතින් සුභාවිත ගීත ලෙසින් මා ලියූ ගීතවලට මුල් වුණේ අර මුලින් කිව්ව කාලයක්, අනිත්‍යතාවත්, අනිත්‍යතාවය තුළින් බිහිවෙන සුන්දරත්වයත් යන කාරණා. එය බර්ග්සෝන් :ඊැරටිදබ* කියන බටහිර දාර්ශනිකයා, කාලය පිළිබඳව ගැඹුරු සංකල්ප, මත පළ කලා. බුදු දහමේ වුණත් ඔය ගැන කියවෙනවනේ. කාලයන් කාලයන් එක්ක ඇතිවෙන වෙනස් වීම් ගැනත් බොහෝ මත පළවෙලා තියෙනවා.

ඉතින් ඔය විදියට ලියවුණ ගීත සම්භාරයක් තියෙනවා. ඔය අතරින් මූලිකව එක ගීතයක් ගත්තොත් එහෙම අමරදේව මහත්මයා ගායනා කරපු "මේ මහ කන්ද" ගීත නම් කරන්න පුළුවන්. ඒ ගීතයේ ලියවුණා මෙන්න මේ විදියට;

"ඔබ මා සමඟ අතිනත ගන්නා දවස
මේ මහ කන්ද බැළුවා හිඳ ගම සිරස"

"ඔබ මා අතෑ'ර වෙන
නුවරක ගිය විගය
මේ මහ කන්ද බැළුවා
හොරැ'හින් ම'දෙස"

"මේ පදවලින් කියවෙන්නේ කාලයාගේ ඇවෑමෙන් සිද්ධවෙච්ච විපර්යාසයක්. ඒ වගේම චිත්ත තත්ත්වයක ඇති වුණ විපරිණාමයක්. කන්ද කාලය පිළිබඳව සංඛේතයක්. කන්ද වෙනස් වෙලා නෑ."

| | |
|---|---|
| ඔබ මා සමඟ අතිනත ගන්නා | දවස |
| මේ මහ කන්ද බැළුවා හිඳ ගම | සිරස |
| ඔබ මා අතැ'ර වෙන නුවරක ගිය | විගස |
| මේ මහ කන්ද බැළුවා හොරැ'හින් | ම'දෙස |
| පෑ දිය නිල්ල සුදු නෙළුමට මිහිර | පොවයි |
| පාළුව ලුහු බඳින කිරළා හඬා | වැටෙයි |
| නොකියූ රහස හද උතුරා වාන් | දමයි |
| මතකයෙ සුවඳ තවමත් මා හිතට | දැනෙයි |

**රචනය : සුනිල් සරත් පෙරේරා**
**තනුව, සංගීතය හා ගායනය : පණ්ඩිත් අමරදේව**

"අපි පෙම්වතුන් විදියට ඉඳිද්දී කියනවා අපේ ප්‍රේමය කන්ද වගේ ස්ථාපිතයි, ස්ථිරසාරයි කියලා. නමුත් ඒ කියූ දේවල් අපේ චිත්ත සංකල්ප එක්ක වෙනස් වෙලා......"

"කවි හා ගීත සාහිත්‍ය යන දෙකම දවසින් දවස අළුත් වෙන්න ඕන. එක තැන තිබුණොත් ඒවායේ දියුණුවක් ඇතිවෙන්නෙ නෑ. මෙතෙන්දි කියන්න ඕන කවි සාහිත්‍යයේ දියුණුවක් ඇති නොවුණ තරම් කියලා. කොළඹ යුගයේ කවි පසු කාලීනව ඇති වුණ පේරාදෙණි යුගයේ කවියට පිටුවහලක් වුණා තමයි. ඒ වගේම මාතර යුගය නොතිබුණානම් කොළඹ යුගය ඇතිවෙන්නෙත් නෑ. ඒ වුණත් කොළඹ යුගය එක තැනක රැඳිලා තිබුණාය කියන්න පුළුවන්. අපි ඒ කවියන්ව හෙළා දකිනවා නෙවෙයි. නමුත් ගීතය එක තැන නොරැඳී ඉදිරියට ආවා. ඒකට හේතුවක් තමයි දාර්ශනික කවිතාව. ඒ කියන්නේ යම්කිසි දාර්ශනික යමක් යම්කිසි නිර්මාණයක් තුළින් ඉදිරිපත් කරීම. මෙය ඉතා වැදගත්."

"මගේ අත්දැකීම් එක්ක කතා කළොත්, ඉරාන කවිය දාර්ශනික බව ගොඩක් රට ශක්තිමත් දාර්ශනික කවිතාවක් පෙන්වනවා. අපේ ගීත රචකයින් ගත්තත් මහගමසේකර එදිරිවීර සරච්චන්ද්‍ර වාගේ ප්‍රවීණ රචකයෝ මේ දාර්ශනික කවිතාව පෙන්නුම් කළා. ඉරානයේ " රොබයියාත්" වාගේ දෙයකින් ලබපු ආභාෂයකුත් මේ අතරේ තිබුණා. ඉරාන කවි තුල මේ කාලය පිළිබඳව කාරණා ගැබ් වුණා. බුදු දහමෙත් තියෙනවානේ මේ කාරණා. ඉතින් මම උත්සහ කළේ සරළ බවින් හරි මේ දාර්ශනික කවිතාව යොදා ගන්න."

"අත්දැකීමක් කියන්නෙ අපි කාලාන්තරයක් තිස්සේ එකතු කරගෙන පුරව ගත්ත දෙයක් වෙන්න පුළුවන්. "මේ මහ කන්ද" ගීතයට මුල්වුන අත්දැකීම මට ආවේ හතර කෝරළෙන්. මම හරිම ප්‍රිය කරන ප්‍රදේශයක් හතර කෝරළය. ඒ කියන්නේ රඹුක්කන ප්‍රදේශය. ඒ මගේ බිරිඳගේ ගම. ඒ පරිසරයම වුණත් මට කවියක් වගේ. රඹුක්කන නගරයට ගියාම පේන කන්දක් තමයි අලගල්ල කන්ද. මහා ප්‍රතාපවත් යෝධයෙක් වගේ. ඒ මිටියාවතේ පහළ තියෙන දෙණි, පෙත්, වට මළු වලින් සැදුණ කුඹුරු වෙල් එළිය වගේ දේවල් මගේ වින්දනයට මුල් වුණා. ඒවා රස විදියට ගබඩා වුණා."

දවසක් අමරදේව මහත්තයත්, ජේ.බී. දිසානායක මහත්තයත් එක්ක මම ගියා අනුරාධපුරයේ තිබුණ සාහිත්‍ය උත්සවයකට. දිවා භෝජනය වෙලාවේ සුධර්මන් ඇහුවා, අමරදේව තුමාත් ඉන්න එකේ ගීතයක් ලියමුද කියලා. තිලක සුධර්මන් මහත්මයා තමයි ඒ දවස්වල රජරට ගුවන් විදුලි සේවයේ අධ්‍යක්ෂකවරයා වෙලා හිටියේ."

"එදා අපි අනුරාධපුර ගියේ "රජ රට රැජිනී" දුම්රියේ උදේ පාන්දර ඉර නැගෙන වෙලාවෙ. අපි දැක්කා මිහින්තලා කඳුවැටියේ දර්ශනය මගේ මතකයට ආවා. ඒ කාලේ ගුවන් විදුලියේ වැඩ කරපු ස්වර්ණ ශ්‍රී බණ්ඩාර මහත්තයත් එතන හිටියා. ස්වර්ණ ශ්‍රී කිව්වා මේ ප්‍රදේශය ගැන යමක් ලියන්න කියලා. ඇත්තටම මම මුලින්ම ලිව්වෙ;

"ඔබ හා සමඟ වැලිබත් උයනා දවස" කියලයි" ඒත් ස්වර්ණ ශ්‍රී අර ඉල්ලීම කළ නිසා ඒ කොලය ඉරලා අයින් කරලා අලුතෙන් ලියන්න ගත්තා;

"ඔබ මා සමඟ අතින'ත ගන්නා දවස......." කියලා"

"රජ රටට අපි වැව් බැඳි රාජ්‍යය කියලත් කියනවානේ. හවස් වෙනකොට මේ වැව් තියෙන ප්‍රදේශවල කිරළා කෑ ගසනවා ඇහෙනවා. හරි පාළු බවක් ඒ හඬේ තියෙන්නේ."

"පාළුව ලුහුබඳින කිරළා හඬා වැටේ......" කියන යෙදුමෙන් යෙදුවේ ඒ පරිසරයේ හුදකලා බව දනවන්න. ඒ වගේ "නොකිව් රහස හද උතුරා වාන් දමයි....." කියන යෙදුමත් ඒ පරිසරයෙන්ම ගත්ත දෙයක්. වැවක් ඒ දිය කඳ උහුලාගෙන ඉඳල බැරිම තැනයි වාන් දමන්නේ. "පෑ දිය නිල්ල සුදු නෙළුමක සුන්දරත්වය කියන්නටයි. මේ යෙදුම් නිරායාසයෙන්ම ආව යෙදුම්. ඉතින් අපි මේ දේවල් ගලාගෙන එන්න කියවලා තියෙන්න ඕන. එතකොටයි දාර්ශනික කවිතාව යමෙක් තුළ ගොඩනැංවිලා නිර්මාණ තුළින් එළි දකින්නේ....."

සුනිල් සරත් පෙරේරා වියතාණන් හා පිළිසඳර තව බොහෝ දිගට ගලා ගියත්, මෙවර "ගී සඳැළුව" ලිපිය වෙනුවෙන් මෙපමණකින් සෑහීමකට පත් වන්නට සිදුවෙයි. එතුමාණන්ගේ දැනුම, කාලය හා සහයෝගය වෙනුවෙන් අපි බොහෝ ස්තූතිවන්ත වන්නෙමු.

